


# අපේ පැරැන්නෝ අයියනායක පිහිටෙන් ගැබ්බර වැව් රැකගත් හැටි

රත්න බී. ඒකනායක

වැව් බැඳි රටේ වැව් ගැබ්බර වී පුපුරා ගියේ අද ඊයේ පමණක් නොවේ. පෙරදා ද ගමරාළගේ හෝ වෙල්විදානේගේ හෝ නොසැලකිල්ල අමතකවීම * අතපසුවීම වැනි හේතූන් නිසා ගැබ්බර වූ වැව් පුපුරා ගිය අවස්ථා වැව් බැඳි රටේ තැනින් තැන නමුත් අදත් දකින්නට ලැබේ.

"කඩවල" වශයෙන් අද පවතින ගම් වැවක් කැඩීයැමෙන් පසුව ඇති වූ ගම්මානයන්ය. මහමාංකඩවල, අත්තනකඩවල, මරදන්කඩවල ආදී වශයෙන් ලකඩවලල නමින් කෙළවර වන හැම ගමකම මුල් ආරම්භය වැවයි. වැවේ වෑ බැම්ම කැඩී විශාල ලෙස හෑරුන වළ කඩවල ලෙස හැඳින්වේ. කඩවලක් හැදුන වැවක් නැවත හැදෙන්නේ කලාතුරකිනි. කඩවල හැදුන වෑ බැම්ම නැවත පිරවූවත් එතැන අවදානමක් පවතී. ඒ නිසා වැවක් සඳහා වෙනත් සුදුසු තැනකට යනවා මිස කඩවලක් හැදුන වැව නැවත හැදීමට උනන්දු වන්නේ කලාතුරකිනි. ලඹලගම්ල වශයෙන් හඳුන්-වන්නේ වැවක් තිබී පසුව නැති වී ගිය එවැනි ගම්ය.

වැවක් ගැබ්බර වූ විට විදේශීය වාරි තාක් ෂණය අනුව අද කරන්නේ හැකිතාක් වාන් දොරටු සහ සොරොව් ඇරීමය. එපමණකින් වැවේ ගැබ්බර අඩු කළ නොහැකි වුවහොත් ඊළඟට වැවේ පිටවාන කපා ජලය මුදාහරිනු ලැබේ. පෙරදා වැහි වතුරෙන් හා එල්ලංගා දියෙන් වැවක් ගැබ්බර වූ විට වැවට අත තියන්නට පෙර පළමුවෙන්ම කරන්නේ කෙම්පහන්ය.

වැවේ ආරක්ෂකයා සහ හිමිකරු අයියනායක දෙවියන් ලෙස සැලකේ. වැව් සංස්කෘතිය අනුව මෙසේය.

"වැව් දස දහසකට අධිපති වූ උතුම් අයියනායක දෙයි හාංදුරුනේ... පුල්ලෙයාර් මුත්තප් පේ.... ඔබ වහන්සේ අපේ ගමේ ගැත්තන්ට කරන්න හදන වින්නැහිය මොකක්ද අප්පච්චියේ...? මේ නොදරුවන් එක්ක ඔබවහන්සේට ඒ ඒ තැනේදී පුද පූජා පඬුරු පාක්කුඩම් ඔප්පු කළ බව හැබෑ නම්... මුට්ටි මංගල්ලෙත් කිරි ඉතුරුම් මංගල්ලෙත් ඉෂ්ට සිද්ධ කළා හැබෑ නම්.... එක දොහක් මඟ නෑර ඔබ වහන්සේ වෙත පුද දී ඇති මේ සංහිඳේ පාන් පත්තු කර ගරුබුහුමන් කළා හැබෑ නම්.... එහෙව් මේ ගැත්තන්ට වැවේ ගැබ්බරය පුපුරා ජීවත්වන්නට ඉඩ නොදී, වැවත් ගමත් බේරා දෙන්න දෙයිහාංදුරුනේ..." මේ ආදී වශයෙන් ඇණාමැති රාළ අයියනායක දෙවියන්ට යාතිකාවක් කර වැවත් ගමත් රැකබලා ගන්නට භාර දෙයි.

ඉන්පසුව වැව භාර ගමරාළ හෝ වෙල්විදානේ... වැවේ වෑකන්දේ පිහිටි ලඅයියනාමුණායටල පැමිණ වෙඩි බෙහෙත් තුවක්කු ඇති හැම දෙනාටම තුවක්කු සූදානම් කරගෙන වහාම අයියනාමුණායට පැමිණෙන ලෙස පණිවිඩ යවයි. ඔවුන් කැඳවන්නේ පූජා වෙඩිල්ල පත්තු කිරීම සඳහාය. අයියනාමුණාය පිහිටා ඇත්තේ හරියටම වෑකන්දේ මැදය. වැවේ මැද ඇත්තේ ද ඊට කෙළිනි. අයියනාමුණායේ සිට වැවේ මැදට ලපූජා වෙඩිල්ලල නමින් හඳුන්වන වෙඩිමුර පත්තු කළයුතුය.

පූජා වෙඩිල්ල තැබීමට පෙර ඇණාමැතිරාළ විසින් බුලත් මඩයක් (බුලත් යහනක්) සකස් කරනු ලැබේ. මේ බුලත් මඩය කුල දෙවියන්ට භාරහාර වන රිදී කාසි පඬුරු වශයෙන් තබනු ලැබේ. ඊට අමතරව අත ඇඟිල්ලක් තරම් මහත වූ අඩි හයක් පමණ දිග ඇති ලී කෝටුවක් පොත්ත ගලවා එය කහ දියරෙන් සෝදා පිරිසිදු කොට එයද බුලත් යහන මත තබා

*මිටි බඳින ලද පිදුරු කට්ට උමඟට කොටනු ලැබේ. මෙය ඉතාමත් බිහිසුණු සහ අවදානම් කාර්යයකි. සුළු ප්‍රමාදයක් හෝ අත්වැරැද්දක් සිදුවුවහොත් උමඟට පිදුරු කවමින් සිටින්නා ද උමඟ තුළින් ජල බලයෙන් ඇදගෙන යයි.*

වැව භාරදී ඇත්තේ අයියනායක දෙවියන්ටය. වැවක වෑබැම්මේ හරි මැද ලඅයියනාමුණායල ලෙස හඳුන්වයි. එතැන "අයියනායක දෙවියන්ගේ තැන" යෑයි විශ්වාස කෙරේ. වැවක් ගැබ්බර වේගෙන එද්දී වැවේ භාරකරු වන වෙල්විදානේ සිහි-බුද්ධියෙන් කටයුතු කළ යුතුය. වැවක් කැඩීයැම යනු වැව විනාශ වී යනවා පමණක් නොව වැව නිසා රැකෙන ගම ද විනාශ වී යැමකි. මේ නිසා ඔහු වගකීමෙන් කටයුතු කළයුතු වේ.

වැවක් ගැබ්බර වේගෙන එද්දී වැව භාර වෙල්විදා-නේ හෝ ගමරාළ පළමුවෙන්ම කරන්නේ ඇණාමැතිරාළ හමුවී වැව වෙනුවෙන්ම වෑකන්දේ කෙළවර රූස්ස ගසක් යට පිහිටුවා ඇති. සංහිඳට ගොස් ඇණාමැතිරාල් මගින් වැව බේරාදෙන ලෙස අයියනායක දෙවියන්ට භාරහාරවීමය. බුලත් මඩේට * මුට්ටි නැවුම් මංගල්ලෙට * කිරි ඉතුරුම් මංගල්ලෙට භාරහාර වී ගමේ ලවැව් දෙයියෝල රැකදෙන ලෙස යාතිකා කරති. එබඳු යාතිකාවක් නැවත වරක් අයියනායක දෙවියන්ගේ පිහිට පතමින් යාඥ කරනු ලැබේ. ඉන්පසුව යහනේ තැබූ ලී කෝටුව රැගෙන කලින් සූදානම්කරගත් කිරි පැණියෙන් සේදූ රිදී කාසියක් ගෙන රෙදි කෑල්ලක ඔතා පඬුරක් මෙන් කෝටුවේ ගැට ගසති. ඊළඟට කෝටුවේ ගැට ගැසූ පඬුර දියඹට යටවන සේ වෑබැම්ම අසලින් ලී කෝටුව සිටුවති. මෙම මූලික කටයුතු නිමවීමෙන් පසුව වැඩ භාරව සිටින ගමරාළ හෝ වෙල්විදානේ තුවක්කුවක් ගෙන අයියනාමුණායට දෙපා තබාගෙන වැව මැදට වෙඩි තුනක් තබයි. ඒ සමඟම හැඩි දැඩි තරුණයෙක් එක දිගට හූ තුනක් තබයි. පූජා වෙඩිල්ල වශයෙන් කරනු ලබන්නේ මෙයයි. මින්පසු තුවක්කු තියෙන අය පිළිවෙළින් අයියනාමුණායට දෙපය තබා වැව මැදට වෙඩිල්ල බැගින් තබනු ලැබේ. මෙසේ පූජා වෙඩි තැබීමෙන් වැවේ ගැබ්බර බව අඩුවී යන බව ගැමියෝ අදහති. එසේ ජලය අඩුවී යන්නේ කලින් සිටුවූ ලී කෝටුවේ පඬුර බැඳ ඇති මට්ටමට බව ද ගැමියෝ අදහති.

මේ කෙම්පහන්වලින් පසුව වැවේ ගැබ්බර බව පැහැදිලිව අඩුකර ගැනීම සඳහා පිටවානට ගොස් වාන මතුපිට පවත්නා පැළෑටි, ගල්මුල් ආදිය ඉවත් කොට අඩියකින් පමණ වාන පාත්කරනු ලැබේ. වාන පිහිටුවා ඇත්තේ වැවේ වතුර බැස්මට අනුවය. මේ නිසා වෑකන්දට දිය පීඩනයක් ඇති නොවී පිටවානෙන් වතුර පිටතට ගලා බසී. පිටවානෙන් වතුර බැසයැමට සැලැස්වීමෙන් අනතුරු කීපයක් ම අවම කර ගැනීමට පුළුවන.

වෑකන්ද මැදින් පුපුරා ගියහොත් වෑකන්දේ බොහෝ ප්‍රමාණයක් සෝදා යමින් කඩවලක්ද සෑදී යටතින් පිහිටි ගම ගෙදර ද දියබත් වී මහත් විනාශයක් සිදුවෙයි. පිටවානෙන් වතුර පිට කළ විට ඒ වතුර බැසයන්නේ වාන් ඇල දිගේ පමණි. පිටවාන පිහිටා ඇත්තේ වෑබැම්මේ කෙළවරකය. පිටවාන පාත්කළවිට වෑබැම්මට එතරම් හානියක් නොවී වාන තුළින් වතුර බැසයයි. ගැබ්බර වූ වැවක ජලය පිටකළ යුතු හොඳම තැන පිටවාන ලෙස පැරැන්නෝ සැලකූහ.

වැවක් ගැබ්බර වූ විට උමං ඇතිවීම ද ස් වභාවයකි. ඊයේ පෙරේදා ඇති වූ ජල පීඩනයේදී තිසා වැවේද නාච්චදූව වැවේද තවත් වැව් ගණනාවක ද උමං ඇතිවිය. ඉතා සුළු හිඩැසකින් වැව් බැම්ම හරහා ඇතිවන උමඟ ඉතා ඉක්මණින් පුළුල් වී ගොස් වෑබැම්මේ අඩක්ම ගලවාගෙන ගොස් මහා විනාශයක් වන්නට පුළුවන. වැවක් ගැබ්බර වූ විට වැව භාරව සිටින මුලාදෑනියාගේ

37 වන පිටට

MONT ALBERT DENTISTS P/L
For all Your Dental Requirements
We Provide
GENERAL DENTAL TREATMENT
COSMETIC DENTAL
TEETH WHITENING
PARTIAL/FULL DENTURES
EMERGENCY SERVICES
WE ACCEPT COMMUNITY DENTAL VOUCHERS, TEEN VOUCHERS, ALL PRIVATE HEALTH INSURANCES AND MEDICARE VOUCHERS FOR APPROVED PATIENTS.
FOR APPOINTMENTS
9890 3609
DISCOUNTS FOR FAMILIES, FREE CHECK UPS FOR KIDS UNDER 7 YEARS
DR. ENOKA JAYATILAKEBANDA (BDS)
MONT ALBERT DENTISTS
2A CHURCHILL ST
MONT ALBERT VIC 3127
(CLOSE TO BOX HILL CENTRAL)
www.montalbertdentists.com.au